ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී/විද්‍යාවේදී (හෙද) අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධි වැඩසටහන
3 වන මට්ටම - 2008/2009
අවසාන පරීක්ෂණය - 2009
ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනය : SSU 1199/NSU 1199

කාලය පැය දෙකයි (02)

දිනය : 2009.01.23 වේලාව : පෙ.ව 9.30 – පෙ.ව 11.30

සෑම කොටසකින්ම ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 25ක් හිමිවේ.

පළමුවන කොටස

1. ශ්‍රී ලංකාවේ බහු වාර්ගික හා බහු සංස්කෘතික සමාජයක් ස්ථාපිත වීමට කුමන කරුණු බලපෑවාදැයි සාකච්ඡා කරන්න.

2. (i) අනුරාධපුර යුගයේ පැවති ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

   (ii) පොළොන්නරුවට එල්ල වූ ආක්‍රමණ එම යුගයේ දේශපාලන ස්ථාවරත්වය බිඳ වැටීමට හේතු විය. සාකච්ඡා කරන්න.

3. පහත සඳහන් මාතෘකා (03) තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) පළමුවන පරාක්‍රමබාහු රජු
   (ii) රෝම ලන්දේසි නීතිය
   (iii) 1833 - කෝල්බෘක් යෝජනා 1848 කැරැල්ලට බලපෑ අයුරු
   (iv) රාජ්‍ය මන්ත්‍රණ සභාව - 1931
   (v) ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය

දෙවන කොටස

4. වැවිලි ආර්ථිකය හඳුන්වාදීමෙන් පසු ශ්‍රී ලංකාවේ යැපුම් ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න.

5. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතරින් තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

   (i) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (1947)
   (ii) ඉඩම් ප්‍රතිසංස්කරණ (1972)
   (iii) ගොවි ජනපද ව්‍යාපාර
   (iv) මූලික අයිතිවාසිකම්
   (v) ඔම්බුඩ්ස්මන් වරයා

******* සියළුම හිමිකම් ඇවිරිණි *******